සුපිරි වෙළඳසැලක දී කාන්තාවකට කාර්යමණ්ඩලයේ කිහිපදෙනකු විසින් පහරදීමේ සිදුවීමක්, පසුගිය දිනවල සමාජ මාධ්‍ය තුළ දැඩි අවධානයට යොමුවී තිබිණි.

එම සිදුවීම සම්බන්ධයෙන් වාර්තා කරනා අරුණ පුවත්පත (සැප්තැම්බර් 25, 2023) එය මෙසේ දක්වයි.

සිරස්තලය - "සුපිරි වෙළෙඳසලක දී, මත්ලෝලී තරුණියකට පහර දුන්නැයි 7ක් අල්ලයි" (එම තැනැත්තිය "මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී සිටින්නියක්" බවට පැවසෙන්නේ යැයි පුවත් අන්තර්ගතයේ දැක්වේ.)

ඔබ සිතන ලෙසට,

1) මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම යනු, සංකීර්ණ කරුණු සමුදායක් හේතු කොට ගෙන සිදුවන, පුනරුත්ථාපනයෙන් හෝ සුව කළ හැකි තත්ත්වයක් මිස, හුදු ලොල් වීමක් නොවන බව කියවේ. එසේනම්, "මත්ලෝලී" වැනි යෙදුම් ඔස්සේ, මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් වැරදි අදහස් සමාජගත නොවන්නේ ද?

2) ඒ වෙනුවට, 'මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ අයෙකු' වැනි යෙදුමක් වඩාත් යෝග්‍ය නොවන්නේ ද?

